---

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන වැඩසටහනේ - අදියර 3 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන කොළඹ මහ නගර සභාව සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 අගෝස්තු 11 දින එළඹි අංක 3348 /3349 දරන ව්‍යාපෘති ගිවිසුමේ 2 ව්‍යවස්ථාව 2.10 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහනේ කාලය**

ණය ගිවිසුම්වලට අනුව එවකට පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය වර්තමානයේ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර කොළඹ මහනගර සභාව සහ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කිලෝමීටර 29.4ක මලාපවහන ජාල එළීම සහ පොම්පාගාර 3ක් ඉදිකිරීම ඇතුළුව දකුණු පෝෂක ප්‍රදේශයේ අපජල පවිත්‍රාගාර පුනරුත්ථාපනය සහ පුළුල් කිරීම සහ ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම හා සේවා සපයන්නන්ගේ ධාරිතා වර්ධනය වැඩසටහනේ අරමුණ වේ. ණය ගිවිසුම්වලට අනුව, වැඩසටහනේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 16,401.76කට සමාන එජඩො මිලියන 112.83ක් වූ අතර ඉන් රු.මිලියන 13,471.16කට සමාන එජඩො මිලියන 92.29ක් ආසියානු සංවර්ධන බැංකුව මඟින් මූල්‍යායනය කිරීමට එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 2,930.60කට සමාන එජඩො මිලියන 20.54ක් ශ්‍රී ලංකා රජය මූල්‍යනය කිරීමට අපේක්ෂා කර තිබුණි. වැඩසටහන එහි කටයුතු 2016 නොවැම්බර් 03 දින ආරම්භ කරන ලද අතර 2020 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, වැඩසටහනේ කාලය 2022 ඔක්තෝබර් 24 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 මතය**

වැඩසටහනේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිත කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 නීති, රීති සහ රෙගුලාසි සමග අනුකූල නොවීම**

| | නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2019 මාර්තු 15 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2019 හි 9.3 ඡේදය | මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස 2 කට වරක් රැස්විය යුතු වුවද 2022 වර්ෂය තුළ මෙහෙයුම් කමිටු රැස්වීම් හතරක් පමණක් පවත්වා තිබුණි. | 2022 ආරම්භයේ ඉන්ධන අර්බුදය සහ අමාත්‍යාංශයේ විෂය පථය නිරන්තරයෙන් වෙනස් වීම හේතුවෙන් රැස්වීම් කැඳවීම සීමා කර තිබුණි. | ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් චක්‍රලේඛ උපදෙස් අනුව පැවැත්විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2019 ජනවාරි 12 දිනැති කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව අංක 01/2019 දරන චක්‍රලේඛය | වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම හතරක් පැවැත්වීමට අවශ්‍ය වේ. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළ එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණි. | අදහස් දක්වා නොමැත | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියමිත පරිදි පැවැත්විය යුතුය. |
| (ඇ) | 2020 පෙබරවාරි 12 දිනැති අංක එම්ඕඑෆ්පී සහ පීඩී/ඊආර්ඩී/2020/1 දරන මුදල්, ආර්ථිකය සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ චක්‍රලේඛය | ණය පිළිබඳ සාකච්ඡා කිරීමට පෙර ණය දෙන නියෝජිතායතනය ඇතුළු අදාළ පාර්ශවකරුවන්ගේ සෑහීමකට පත්වන පරිදි ඉඩම් අත්පත් කර ගැනීම/නැවත පදිංචි කිරීම සම්පූර්ණ කළ යුතුය. කෙසේවෙතත්, ඉඩම් අත්පත් කරගැනීමට සහ නැවත පදිංචි කිරීමට පෙර ගිවිසුම අත්සන් කර තිබුණි. | අදහස් දක්වා නොමැත | චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුයි. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

| සංරචකය | 2022 දෙසැම්බර් 31 දිනට | | විගණන නිරීක්ෂණ | ප්‍රමාදය සඳහා හේතු |
|---|---|---|---|---|
| | අපේක්ෂිත භෞතික කාර්යසාධනය | අත්කරගත් කාර්යසාධනය | | |
| | ප්‍රතිශතය | ප්‍රතිශතය | | |
| (අ) කිරුළපන පෝෂක ප්‍රදේශය සඳහා නව ගුරුත්වාකර්ෂණ මලාපවහන ජාලයක්, පීඩන මධ්‍යස්ථාන සහ පොම්පාගාර ඉදිකිරීම | 100 | 70 | කොන්ත්‍රාත්තුව 2017 මැයි 18 දින ආරම්භ කර 2020 මැයි 14 දින අවසන් කිරීමට නියමිතව තිබුණද, කොන්ත්‍රාත්තුව 2022 ජූලි 30 දක්වා දීර්ඝ කරන ලදී. ඒ අනුව කොන්ත්‍රාත්තුව වර්ෂ දෙකක පමණ කාලයක් ප්‍රමාද වී ඇති බව නිරීක්ෂණය විය. | කොන්ත්‍රාත්කරුගේ මන්දගාමී භෞතික ප්‍රගතිය, අවශ්‍ය සම්පත් අවභාවිතය, දුර්වල සැලසුම්කරණය සහ නිසි අධීක්ෂණයක් නොමැතිකම සහ ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ තීරණ ප්‍රමාද වීම හේතුවෙන් වේ. |
| (ආ) වැල්ලවත්ත අපජල පවිත්‍රාගාරය ඉදිකිරීම | 100 | 7 | වැල්ලවත්ත අපජල පවිත්‍රාගාරය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2017 ජූනි 21 දින ආරම්භ කර 2019 දෙසැම්බර් 14 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේවෙතත්, මාස 30ක ප්‍රමාදයකින් පසුව 2020 | (i) ගිවිසුම 2021 ඔක්තෝබර් 21 දින කොන්ත්‍රාත්කරු සමඟ අත්සන් කර ඇති අතර ගිවිසුම සහ පිළිගැනීමේ ලිපියට අනුව ඉඩම මාස තුනක් ඇතුළත ඉදිකිරීම් කටයුතු සඳහා |

| | | | |
|---|---|---|---|
| | | දෙසැම්බර් 18 වැනි දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. | කොන්ත්‍රාත්කරුට භාර දිය යුතුය. කෙසේවෙතත්, එය 2021 දෙසැම්බර් 31 දක්වා භාර දී නොතිබුණි.<br><br>(ii) මේ සඳහා කොළඹ මහ නගර සභාවේ රුද්‍රා ක්‍රීඩාංගනය තෝරාගෙන 2009 සැප්තැම්බර් 28 දිනැති අංක 543 යෝජනාවෙන් අනුමැතිය ලබා දී ඇත. කොළඹ මහ නගර සභාව විසින් 2021 දෙසැම්බර් 31 දින වන විටත් එම ඉඩමකොන්ත්‍රාත්කරුට ලබාදීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) කිරුළ - 100 නාරාහේන්පිට ප්‍රදේශයට මලාපවහන පහසුකම් ලබාදීම | පූර්ව කොන්ත්‍රාත් අදියරෙන් 92 | කොන්ත්‍රාත්තුව 2017 ඔක්තෝබර් 23 වන දින ආරම්භ කර 2020 අප්‍රේල් 10 වන දින අවසන් කිරීමට නියමිතව තිබුණද, 2021 දෙසැම්බර් 31 දිනවන විටත් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොතිබුණි. | (i) වර්ෂ 30කට අදාළ ඉඩමේ සම්පූර්ණ බදු වටිනාකම නාගරික සංවර්ධන අධිකාරියට ගෙවා තිබුණද 2022 පෙබරවාරි 28 දිනට නාගරික සංවර්ධන අධිකාරිය සමඟ විධිමත් බදු ගිවිසුමක් අත්සන් කර නොතිබුණි.<br><br>(ii) දුම්රිය දෙපාර්තමේන්තුවෙන් බදු දෙනලද ඉඩමේ පදිංචිව සිටි පවුල් 6ක් නැවත පදිංචි කිරීම සඳහා රු. 30,060,000ක් වැය කර තිබුණද, එම පවුල් 2021 දෙසැම්බර් 31 වැනිදා දක්වා එම ඉඩමෙන් ඉවත් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) දකුණු ජල පෝෂක ප්‍රදේශවල දෝෂ සහිත මලාපවහන අලුත්වැඩියා කිරීම සහ අඩු ධාරිතාවයෙන් යුත් මලාපවහන ඉහළ නැංවීම සහ ක්‍රියාත්මක කිරීම. | 100 | පූර්ව කොන්ත්‍රාත් අදියරෙන් 75 | කොන්ත්‍රාත්තුව 2019 නොවැම්බර් 01 වන දින ආරම්භ කර 2021 දෙසැම්බර් 05 වන දින අවසන් කිරීමට නියමිතව තිබුණද, 2021 දෙසැම්බර් 31 වන විට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොතිබුණි. | ඉහල මට්මේදී අඩු ප්‍රමුඛතාවයක් ලබා දීම සහ කොන්ත්‍රාත්තුවේ විෂයපථය පිළිබඳව අවසන් නිගමනයකට නොඑළඹීම. |
| (ඉ)මූල්‍ය කළමනාකරණය සහ ගිණුම්කරණ පද්ධතිය (FMAS) | 100 | 100 | ජලාපවහන අංශයට හඳුන්වා දුන් රු. 3,159,879ක් වටිනා මූල්‍ය කළමනාකරණ සහ ගිණුම්කරණ පද්ධතිය 2017 වර්ෂයේ සිට අක්‍රියව පැවතුණි. | (i) මෙම පැකේජය ක්‍රියාත්මක කිරීමේ වගකීම නිල වශයෙන් නිලධාරීන් වෙත පවරා නොමැති අතර පැකේජය ස්ථාපනය කර ඇති පරිගණකයේ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොමැත.<br><br>(ii) මෙම පැකේජය මිලදී ගැනීම සඳහා වන තාක්ෂණික ඇගයීම් කමිටුව පැකේජය ස්ථාපනය කිරීමෙන් පසු වසර 3ක කාලයක් සඳහා පශ්චාත් වගකීම් සහ නඩත්තු ගිවිසුමකට එළඹීමට නිර්දේශ කර තිබුණද, එම අනුකූලතාව තහවුරු කිරීම සඳහා විගණන සාක්ෂි ඉදිරිපත් කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම සහ සේවා සපයන්නාගේ ධාරිතාව වැඩිකිරීම | 100 | 38 | මෙම සංරචකය යටතේ ක්‍රියාකාරකම් හතරක් 2022 දෙසැම්බර් 31 වන විට අවසන් කර නොතිබුණි. | කොන්ත්‍රාත්කරුගේ මන්දගාමී භෞතික ප්‍රගතිය, දුර්වල සැලසුම්කරණය, විධිමත් අනුමැතියක් නොමැතිවීම සහ ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ තීරණ ප්‍රමාද වීම හේතුවෙන් වේ. |

**කළමනාකරණයේ අදහස් දැක්වීම** — කොන්ත්‍රාත්කරුට වැඩබිම පැවරීම ප්‍රමාද වීම සහ කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය ප්‍රධාන වශයෙන් කොන්ත්‍රාත් කාලය තුළ කොන්ත්‍රාත්තුව අවසන් කිරීම ප්‍රමාද වීමට හේතු විය.

**විගණකගේ නිර්දේශය** — ව්‍යාපෘති කාලසීමාව අවසන් වීමට පෙර ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ.

## 3.2 මතභේදයට තුඩුදෙන ගැටළු

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පැන නගින ගැටලුවලට කඩිනම් විසඳුම් ලබාදීම සඳහා 2010 වර්ෂ සිට කොළඹ මහ නගර සභාවේ, පළාත් පාලන අමාත්‍යාංශයේ සහ බස්නාහිර පළාත් සභාවේ නිලධාරීන්ගෙන් සමන්විත ප්‍රතිපත්ති සහයක කණ්ඩායමක් පත්කර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දින වන විට එම නිලධාරීන්ට රු මිලියන 6.5ක් වැටුප් ලෙස ගෙවා තිබුණි. කෙසේවෙතත්, ගිවිසුම්ගත කාල සීමාව තුළ ණය මුදල භාවිත කළ නොහැකි වූ අතර, ඒ අනුව භාවිතයට නොගත් ණය ශේෂය සඳහා කැපවීමේ ගාස්තු ලෙස 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 118.7 ක් ආසියානු සංවර්ධන බැංකුවට ගෙවිය යුතු විය. ඒ අනුව ව්‍යාපෘතිය සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ඉහත ප්‍රතිපත්ති සහයක කණ්ඩායමෙන් සහයක් නොලැබුණු බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘතිය නිම කිරීම ප්‍රමාද වීමට අදාළ හේතු ප්‍රතිපත්ති සහයක කණ්ඩායමේ පාලනයට යටත් නොවේ | ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සක්‍රීයව දායක විය යුතු අතර ඔවුන්ගේ කාර්ය සාධනය ඇගයීමට ලක් කළ යුතු අතර නිසි ව්‍යාපෘති සැලසුම් කිරීම තුළින් මෙම පිරිවැය අවම කළ යුතුය. |
| (ආ) | ණය ගිවිසුමට අනුව, වැඩසටහන 2016 නොවැම්බර් 3 වන දින ආරම්භ කිරීමට නියමිතව තිබූ අතර 2020 දෙසැම්බර් 31 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේවෙතත්, වැඩසටහනේ අවසාන දිනය 2022 ඔක්තෝබර් 24 දක්වා දීර්ඝ කරන ලදී. | ව්‍යාපෘති කොන්ත්‍රාත්තුවේ මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් දීර්ඝ කිරීමට සිදු විය. | ව්‍යාපෘති කාලසීමාව අවසන් වීමට පෙර ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. |